# විශ්වාස කළ හැකි මිත්‍රයෙක්



එක් කලෙක එක් ගොවියෙකුට තමාට ඉතා ප්‍රයෝජනවත්වූ බල්ලෙක් සිටියේය. නමුත් බල්ලා මහළු වූ කල කෙලෙහි ගුන නොදත් උගේ ස්වාමියා ඌව දියේ ගිල්වා මරාදැමීමට සිතුවේය. එක් දවසක ඔහු තමාගේ ගොවිපොළ අසල තිබෙන විශාල ඔයකට බල්ලා සමග ගොස්, ඔරුවකට නැග, ඔයේ ගැඹුරුම කොටසට ඔරුව පැද්දේය. ඔහු තමා ගෙන ආ බර ගලක් ගෙන එය ලනුවකින් බල්ලාගේ බෙල්ලට තබා බැන්දේය. ඊට පසු ඔහු බල්ලාව වතුරට වීසි කළේය. ඒ අසරණ බල්ලා දියෙහි ගිලුන නමුත් ලනුව කැඩී ගිය නිසා ඌට දිය මතුපිටට ඒමට හැකි විය. කෙඳිරි ගාමින් ඔරුවට නගින්ට උත්සාහ ගත් බල්ලාට දැඩි සිතකින් යුත් ඔහුගේ නපුරු අයිතිකාරයා ඔරු හබලෙන් කීප විටක්ම ඌව තල්ලු කර දැමුවේය.

මේ නපුරු මනුෂ්‍යයා බල්ලාට මරු පහරක් ගසන්ට නැගිට්ට නමුත් එසේ කරන්ට යන විට ඔහු වතුරට වැටුනේය. පීනන්නට නොදත් ඔහු ගිලෙන බව නියතයි. එහෙත් මේ උදාර බල්ලා උගේ ස්වාමියා වතුරේ අතපය ගසමින් දඟලනවා දැක ඔහු වෙතින් ඌ ලැබූ කෲර සැලකිල්ල නොතකා ඔහු වෙතට පීනා ගොස් ඔහුගේ ඇඳුම්-වලින් අල්ලා අනතුරක් නැතිව ගොඩට ගෙනා



Sinhala-6

වේය. මෙවැනි උදාර බල්ලෙකුට කෲර අන්දමින් සැලකූ දැඩි නපුරු සිතක් ඇති ඒ නීච මනුෂ්‍යයා දියේ ගිලී මැරෙන්ට හැරියා නම් යහපතැයි අපි සිතමු. මෙතැනදී අප බලාපොරොත්තු වන්නේ මේ මනුෂ්‍යයා තමාගේ නපුරු සිත වෙනස් කොට පසුතැවිලි වී තමාව බේරාගත් ඒ විශ්වාසවන්ත මිත්‍රයාට කරුණාව පෙන්වන බවයි. නමුත්, ප්‍රිය මිත්‍රය, මොහොතකට නවතින්න. ඔබත් මෙයට වඩා නපුරු අන්දමට කරුණාව සහ අවංකකමේ නිති කඩ කිරිම ගැන වැරදිකාරයකු වී නැද්ද කියා සිතන්න. අවුරුදු එකදහස් නවසිය ගණනකට පෙර දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේ මේ ලොවට ආ කාලය දෙස බලමු. උන්වහන්සේ සත්‍යය සහ ආලෝකය වූ දෙවියන්වහන්සේ වුනත්, දුප්පත් කඩාකප්පල් වූ මනුෂ්‍යයාට ප්‍රේමය සහ ආශීර්වාදය මිස වෙන කිසිවක් ගෙනාවේ නැත. උන්වහන්සේ රෝගීන් සුව කිරීම, අන්ධයින්ට පෙනීම දීම, මළවුන්ගෙන් නැගිටවීම, කුසගින්නෙන් පෙලෙන්නවුන්ට ආහාර දීම සහ වෙහෙස වන්නාවූ, දුක්ඛිත අයට ප්‍රීතිය ගෙන ඒම ආදී යහපත් ක්‍රියා කරමින් ද හැසුරුනු සේක. නමුත් මනුෂ්‍යයන් උන් වහන්සේට කළේ කුමක්ද ? ඔවුහු ''මොහු පහකරන්න'' කියා මොරගසා උන්වහන්සේව ලී කුරුසියකට තබා ඇණ ගැසුවෝය. අහෝ, මනුෂ්‍යයාගේ හෘදයේ තිබෙන



කාලකණ්ණිකම, දුෂ්ටකම සහ සතුරුකම! ඔබගේත් මගේත් හදවත්ද මේ ආකාරයය. **''සියල්ලට වඩා සිත රැවටිලිකාරව තිබේ. ඒක දූෂ්‍යව තිබේ. ඒක කාට දැනගන්ට පුළුවන්ද ? ''** (යෙරෙමියා 17:19) යි බයිබලය පවසයි. අප එක අතකින් උන්වහන්සේගේ ආශිර්වාද ලබාගන්න අතර දෙවියන්වහන්සේගේ කැමැත්ත අපේ කැමැත්තට හරස්වන විට ඊළඟ මොහොතේ උන්වහන්සේව ඉවත් කරන්නෙමුව. එසේ වුවද දෙවියන්වහන්සේගේ හෘදය කොයි ආකාරදැයි මැද කුරුසිය මත සිටින ඒ ආශීර්වාදලත් මනුෂ්‍යයා දෙස බැලීමෙන් දැනගන්නට අපට පුළුවන. නිග්‍රහ කිරීමේ හෝ විරෝධය දක්වන වදනක්වත් විරුද්ධව ඔසවන ඇඟිල්ලක්වත් නැත. ''උන්-වහන්සේට පීඩා කළ විට උන්වහන්සේ යටත් වී තමන්ගේ මුඛය නෑර සිටිසේක. මරන්නට ගෙනයන බැටළු පැටවකු මෙන්ද, බැටළු දෙනක් ලෝම කපන්නන් ඉදිරියෙහි නිශ්ශබ්දව සිටින්නාක් මෙන්ද උන්වහන්සේ තමන්ගේ මුඛය නෑර සිටි සේක.'' මෙය පව්කාරයන් පිරි ලෝකයට පිටත්ව ආ නිර්මල ප්‍රේමයයි.

උන්වහන්සේ විවෘතවූ සිතක් සහ දිගු කළ දෑත් ඇතිව සිටින සේක.

උන්වහන්සේ තමන්ට විරුද්ධවූවන්ට සමාව කළ නොහැකි කරුණාව පෙන්වන සේක. ''පියාණෙනි, ඔවුන්ට කමාවුව මැනව, මක්නිසාද ඔවුන් කරන්නේ මොකක්ද කියා ඔවුහු නොදනිති'' උන්වහන්සේ මෙලෙස යාච්ඤා කරනවා අපට ඇසේ. කුරුසියක මරණ දඬුවමක් තුළින් උන්වහන්සේව ඉවත් කිරීමට මනුෂ්‍යයන් උත්සාහ කළ මුත්, එම කුරුසියම, තමන්ගේ පව් ගැන පසුතැවිලි වී, උන්වහන්සේ තම ගැලවුම්කරුවාණන් හැටියට පිළි ගන්නා අයට අනුග්‍රහය ගලා යන තැනක් බවට පත් විය. විශ්වාසවන්ත බල්ලා හැරී තමාගේ ස්වාමියාගේ ජීවිතය බේරාගත් බව අපි දනිමු. නමුත් යේසුස්වහන්සේ ගලවා ගන්නවුන් සදකාලික ගැළවුමක් ලබයි. උන්වහන්සේ ''අදහන්නාවූ කවරෙකුට වුවත්'' සදකාල ජීවනය දෙන සේක.

ප්‍රිය පාඨකය, ඔබ තවම මේ ආශිර්වාදලත් ගැළවුම් කාරයාණන් හඳුනන්නේ නැති නම් උන්වහන්සේගේ අනුග්‍රහය ඇති දවස් තවමත් ඉකුත්ව නැති නිසා උන් වහන්සේ වෙනට එන්නටයි අපි ඔබට ආරාධනය කරමු.

යේසුස්වහන්සේ ඉතා ඉක්මනින් ලෝකය විනිශ්චය කරනු පිණිස එන සේක. එවිට '' උන්වහන්සේගේ උදහස, උඳුනක් සේ



ඇවිලෙන්නේය'' ඒ දරුණු දවසේදී දුෂ්ඨයා සහ පව්කාරයා කෙලෙස කොතැනදී පෙනී සිටීද?

අප කෙරෙහි තිබෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරනු ලැබුවේ, දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් කරණකොට ගෙන අප ජීවත්වන පිණිස උන්වහන්සේ ලෝකයට එවූ කාරණයෙන්ය.

ප්‍රේමය මේය, එනම් අප දෙවියන්වහන්සේට ප්‍රේම කළා නොව උන්වහන්සේ අපට ප්‍රේම කොට, අපේ පව් උදෙසා ශාන්තිකර පූජාව වන පිණිස තමන්ගේ පුත්‍රයා එවූ බවයි. **(1 යොහන් 9:9,10)**